01.12.2024

# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව

## සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර,ස්වයංගාමක,වෘත්තීය උන්නතිගාමී කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළ හැකි අයවලුන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමඟ අත්වැල් බැඳ ගැනීම අපි අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවෙකුම,**

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii. තනතුරේ වගකීම් නිසිලෙස ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හැකි මනා ශාරීරික සහ මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
iii. මනා චරිතයකින් යුක්ත අයෙකු විය යුතුය.

### (1) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - මානව සම්පත් තනතුර (HM 1-1)

**රාජකාරි:**

මානව සම්පත් හා පරිපාලන අංශයේ ප්‍රධානී ලෙස මානව සම්පත් හා පරිපාලනයට අදාළ සියලු කටයුතු සඳහා සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය , එනම්,

1. පැවරුම් විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, එක් එක් විෂයට අදාළ වැඩසටහන් සඳහා නිර්දේශ කිරීම.
2. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම.
3. රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ පොදු කාර්යාල පද්ධති සහ ක්‍රියා පටිපාටි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම.
4. මානව සම්පත් කළමනාකරණය සහ පරිපාලනය සම්බන්ධ සියලුම කාර්යයන් සඳහා සහභාගී වීම.
5. රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
6. නිෂ්පාදන අංශයේ යහපත් නිෂ්පාදන පුරුදු ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා සහාය වීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අනුගත වීම.

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

අ) (i)විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් මානව සම්පත්/ කළමනාකරණය / පරිපාලනය පිළිබඳ ඉහළ පෙළ ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්.

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් මානව සම්පත් / පරිපාලනය පිළිබඳ විශේෂ උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්.

හෝ

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත්, මානව සම්පත් / පරිපාලන/ නීතිය යන විෂය ඇතුළුව ප්‍රථම උපාධියක් හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ සමාන සුදුසුකම්.

සහ

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයක, මානව සම්පත්/ කළමනාකරණය / පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධි (Masters) සුදුසුකම්.

සහ

ඇ) රජයේ /රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, මානව සම්පත් / පරිපාලනය විෂය ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් - අභ්‍යන්තර අපේක්ෂකයින්**

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක කළමණාකාර මට්ටමේ (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක අඛණ්ඩ සේවය

**වැටුප් පරිමාණය** - HM 1-1 – රු. [80,295 - 15 x 2,270 = 114,345]

**වයස** - අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120ක්)

## (2) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - තත්ත්ව පාලන තනතුර (HM 1-1)

**රාජකාරි:**

තත්ත්ව පාලන අංශයේ ප්‍රධානී සහ තත්ත්ව පාලනයට අදාළ සියලු කටයුතු සඳහා සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය.

1. රසායනාගාර කාර්ය මණ්ඩලයේ කටයුතු සංවිධානය කිරීම සහ අධීක්ෂණය කිරීම.
2. බෙදා හැරීම සඳහා සියලුම සංරචක, ඖෂධ නිෂ්පාදන බහාලුම්, වසා දැමීම්, සැකසෙමින් පවතින ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය, ලේබල් සහ නිමි ඖෂධ නිෂ්පාදන අනුමත කිරීමට හෝ ප්‍රතික්ෂේප කිරීමට වගකීම සහ අධිකාරිය.
3. ඖෂධ නිෂ්පාදනවල ස්ථායීතාව නිරීක්ෂණය කිරීම සහ කල් තබා ගත හැකි කාලය පුරාවට එහි ගුණාත්මකභාවය සහතික කිරීම, අනුකූල වීම සඳහා ලෝක සෞඛ්‍ය සංවිධානයේ වත්මන් යහපත් නිෂ්පාදන පුරුදු (cGMP) නිරීක්ෂණය කිරීම.
4. මිලදී ගත යුතු ආරම්භක ද්‍රව්‍ය, ඇසුරුම් ද්‍රව්‍ය සඳහා පිරිවිතර අනුමත කිරීම.
5. නිෂ්පාදන අංශයේ යහපත් නිෂ්පාදන පුරුදු අධීක්ෂණය කිරීම සහ නිෂ්පාදන ක්‍රියාකාරිත්වයේ දී සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) සමඟ අනුකූල වීම අධීක්ෂණය කිරීම.
6. ජලයේ ගුණාත්මකභාවය සහ අපජල පද්ධතිය අධීක්ෂණය කිරීම.
7. වෙළඳපොලේ සිටින තරඟකරුවන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය නිරීක්ෂණය කර අපගේ නිෂ්පාදන සමඟ සැසඳීම සහ අවශ්‍ය වුවහොත් අපගේ නිෂ්පාදන වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ලබා දීම.
8. වෙළඳපල පැමිණිලි සඳහා සුදුසු පියවර ගැනීම.
9. විශ්ලේෂණ ක්‍රියා පටිපාටි ඇතුළුව සුදුසු වලංගුභාවයට පත් කිරීම් සහ උපකරණ ක්‍රමාංකන පාලනය කිරීම සිදු කර ඇති බවට සහතික වීම.
10. රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
11. නිෂ්පාදන අංශයේ cGMP ක්‍රියාත්මක කිරීමට අධීක්ෂණය සහ සහාය වීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අනුගත වීම.

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබාගත් පළමු හෝ දෙවන පන්තිය සහිතව රසායන විද්‍යාව විෂය ඇතුලත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාවේ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාල සමාන සුදුසුකම්.

හෝ

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව විෂය ඇතුලත්ව ලබා ගත්, විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාල සමාන සුදුසුකම් ලබා තිබීම.

සහ

ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් විශ්ලේෂණ රසායන විද්‍යා ක්ෂේත්‍රයට අදාළ හෝ ඖෂධ පිළිබඳ ඕනෑම විද්‍යාත්මක පරීක්ෂණ / විශ්ලේෂණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

හෝ

(ii) රසායන විද්‍යායතනයේ ආයතනික සාමාජිකත්වය

සහ

ඇ) රජයේ /රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, ඖෂධ/ ආහාර ක්ෂේත්‍රයේ විද්‍යාත්මක ඇගයීම්/ රසායනාගාර පරීක්ෂණ / නිෂ්පාදන හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් - අභ්‍යන්තර අපේක්ෂකයින්**

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක කළමණාකාර මට්ටමේ (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක අඛණ්ඩ සේවය

**වැටුප් පරිමාණය** - HM 1-1 – රු. [80,295 - 15 x 2,270 = 114,345]

**වයස** - අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්

- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120ක්)

## (3) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන තනතුර (HM 1-1)

**රාජකාරි:**

වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන අංශයේ ප්‍රධානී ලෙස රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වට්ටෝරු, පර්යේෂණ සහ සංවර්ධන කටයුතුවලට අදාළ සියලු කටයුතු සඳහා සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ හෝ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය.

1. යටත් කාර්ය මණ්ඩලයට නව නිෂ්පාදන සැකසීම්, ක්‍රම සංවර්ධනය සහ වලංගුභාවයට පත් කිරීම් පිළිබඳ මාර්ගෝපදේශ සහ උපදෙස් ලබා දීම.
2. නව නිෂ්පාදන ලියාපදිංචි කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම.
3. නිෂ්පාදන පරිමාණය දක්වා පරිමාණය කිරීම සහ ක්‍රියාවලි වලංගු කිරීම.
4. ක්‍රියාවලි වැඩිදියුණු කිරීම්, තත්ත්ව වැඩිදියුණු කිරීම් සහ ඵලදායිතා වැඩිදියුණු කිරීම් පිළිබඳ තාක්ෂණික උපදෙස් ලබා දීම.
5. ආරම්භක ද්‍රව්‍ය මිලදී ගැනීමේදී සලකා බැලිය යුතු තත්ත්ව පිරිවිතර නිර්ණය කිරීම.
6. පවතින නිෂ්පාදන හා සම්බන්ධ කඩින් කඩ නිෂ්පාදන ගැටළු නිරාකරණය කිරීම සඳහා උපදෙස් ලබා දීම සහ විසඳුම් ලබා දීම.
7. දෙපාර්තමේන්තුවේ සංවර්ධන සැලසුම් ඇගයීම සහ සලකා බැලීම සහ අනුමැතිය සඳහා සාමාන්‍යාධිකාරී වෙත යොමු කිරීම.
8. නිෂ්පාදන සංවර්ධනය සහ වැඩිදියුණු කිරීම් ආශ්‍රිත පර්යේෂණ ව්‍යාපෘති සඳහා අධීක්ෂණය සැපයීම.
9. අවශ්‍ය වූ විට සහ වෙනත් ආයතනවල සහයෝගීතාවයෙන් සායනික පරීක්ෂණ, / ජෛව උපයෝගීතා අධ්‍යයනයන් ආරම්භ කිරීම.
10. නිෂ්පාදන අංශයේ යහපත් නිෂ්පාදන පුරුදු ක්‍රියාත්මක කිරීමට අධීක්ෂණය සහ සහාය වීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අනුගත වීම.

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් පළමු හෝ දෙවන පන්තිය සහිතව රසායන විද්‍යාව විෂය ඇතුලත්ව විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

හෝ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාවේ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම්.

හෝ

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් රසායන විද්‍යාව විෂය ඇතුළුව ලබා ගත්, විද්‍යාවේදී සාමාන්‍ය උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් ලබා තිබීම.

සහ

ආ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත්, විශ්ලේෂණ රසායන විද්‍යා ක්ෂේත්‍රයට අදාල හෝ ඖෂධ පිළිබඳ ඕනෑම විද්‍යාත්මක පරීක්ෂණ / විශ්ලේෂණ පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

හෝ

(ii) රසායන විද්‍යායතනයේ ආයතනික සාමාජිකත්වය

සහ

ඇ) රජයේ /රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, ඖෂධ/ ආහාර ක්ෂේත්‍රයේ විද්‍යාත්මක ඇගයීම්/ රසායනාගාර පරීක්ෂණ / නිෂ්පාදන හා පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් - අභ්‍යන්තර අපේක්ෂකයින්**

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක කළමණාකාර මට්ටමේ (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක අඛණ්ඩ සේවය

**වැටුප් පරිමාණය** - HM 1-1 – රු. [80,295 - 15 x 2,270 = 114,345]

**වයස** - අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්

- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120ක්)

## (4) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී - අලෙවි තනතුර (HM 1-1)

**රාජකාරි:**

අලෙවිකරණ අංශයේ ප්‍රධානී ලෙස අලෙවිකරණයට අදාළ සියලු කටයුතු සඳහා සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ සහ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය.

1. පැවරුම් විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම් සකස් කිරීම, එක් එක් විෂයට අදාළ වැඩසටහන් සඳහා නිර්දේශ කිරීම.
2. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම සහ අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම.
3. ඖෂධ අලෙවිය සහ බෙදා හැරීම, වෙළඳපල පර්යේෂණ, විකුණුම් වැඩි කිරීම සඳහා උපාය මාර්ග සකස් කිරීම.
4. මිල තීරණය කිරීමේ දායකත්වය සැපයීම.
5. බෙදාහරින්නන්ගේ කාර්ය සාධනය ඇගයීම, අංශයේ පරිපාලන කටයුතුවලට සහභාගී වීම.
6. ආයතනය තුළ සම්බන්ධීකරණය සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සහ රාජ්‍ය නොවන ආයතන සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
7. ඇණවුම් ඉටු කිරීම සඳහා අදාළ අයිතම නිවැරදි ප්‍රමාණයෙන් නිපදවා ඇත්ද යන්න සහතික කර ගැනීම සඳහා නිෂ්පාදන කළමනාකරු සමඟ වඩා හොඳ සම්බන්ධීකරණයක් පවත්වා ගත යුතුය.
8. නිෂ්පාදන අංශයේ යහපත් නිෂ්පාදන පුරුදු ක්‍රියාත්මක කිරීමට අධීක්ෂණය සහ සහාය වීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අනුගත වීම.

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්ව විද්‍යාලයකින් ලබා ගත් අලෙවිකරණය/ වාණිජ/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ප්‍රථම උපාධියක් හෝ විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ක්ෂේත්‍රයට අදාළ සමාන සුදුසුකම් ලබා තිබීම.

සහ

ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් අලෙවිකරණය/ වාණිජ/ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ක්ෂේත්‍රයට අදාළ වන පශ්චාත් උපාධියක් (Masters) ලබා තිබීම.

සහ

ඇ) රජයේ /රාජ්‍ය සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක, අලෙවිකරණ ක්ෂේත්‍රයට අදාළ කළමනාකරණ මට්ටමේ (MM 1-1) අවම වශයෙන් වසර 12ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද ලබා තිබීම.

**සුදුසුකම් - අභ්‍යන්තර අපේක්ෂකයින්**

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයක කළමණාකරණ මට්ටමේ (MM 1-1) I ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර දෙකක (02) සතුටුදායක අඛණ්ඩ සේවය

**වැටුප් පරිමාණය** - HM 1-1 – රු. [80,295 - 15 x 2,270 = 114,345]

**වයස** - අවුරුදු 35ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය** - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**අනෙකුත් ප්‍රතිලාභ**

- සංස්ථාව විසින් නඩත්තු කරනු ලබන නිල වාහනයක් හෝ අංක PED 1/2015 (i) චක්‍රලේඛය ප්‍රකාරව තමන්ගේ වාහනය සඳහා දීමනාවක්
- ඉන්ධන දීමනාව (මාසිකව ඩීසල් හෝ පෙට්‍රල් ලීටර් 120ක්)

## (5) පුද්ගලික ලේකම්
## ( JM 1-1 - II ශ්‍රේණිය )

**රාජකාරි:**

1. ලේකම් කාර්යයට අදාළ සියලු කටයුතු සඳහා සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ හෝ සාමාන්‍යාධිකාරී වෙත වගකිව යුතුය.
2. රැස්වීම් සම්බන්ධීකරණය, සභාපති හෝ සාමාන්‍යාධිකාරී සමඟ සාකච්ඡා කිරීම.
3. රහස්‍ය ලේඛන වල භාරකාරත්වය සහ හැසිරවීම.
4. විගණන විමසුම් සඳහා පිළිතුරු සම්පාදනය කිරීම.
5. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ ටෙන්ඩර් මණ්ඩලවලට අදාළ මණ්ඩල පත්‍රිකා සහ කාර්යයන් සකස් කිරීම.
6. ERP පද්ධතියට සම්බන්ධ වීම.
7. යහපත් නිෂ්පාදන පුරුදු නඩත්තු කිරීම සහ රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ තත්ත්ව කළමනාකරණ පද්ධතිය සඳහා අනුගත වීම.
8. සභාපති/කළමනාකාර අධ්‍යක්ෂ හෝ සාමාන්‍යාධිකාරී විසින් පවරන ලද වෙනත් වගකීම් ඉටු කිරීම.

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

(අ) ලේකම්වරුන්ගේ වරලත් ආයතනයේ "වරලත් ලේකම්" සහතිකය

සහ

(ආ) මිනිත්තුවකට වචන 40ක යතුරු ලියන වේගයක් හා මිනිත්තුවකට වචන 80ක ලඝු ලේඛන වේගයක් තිබිය යුතුය.

සහ

(ඇ) පරිගණක සාක්ෂරතාවය

සහ

(ඈ) රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ලේකම් කාර්යයන් පිළිබඳ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 10 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද

**සුදුසුකම් : අභ්‍යන්තර අයදුම්කරුවන්**

(1) ඉහත බාහිර අපේක්ෂකයක් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම

හෝ

(2) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන II ශ්‍රේණියේ (MA ) තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම

**වැටුප් පරිමාණය** - JM 1-1 - රු. [42,600 - 10 x 755 - 18 x 1,135 - 70,580]

**වයස** - අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය** - ලිඛිත පරීක්ෂණයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

## (6) නඩත්තු තාක්ෂණ ශිල්පී (විදුලි /විද්‍යුත් / යාන්ත්‍රික හා වායු සමීකරණ) තනතුර (MA 2-1 – III ශ්‍රේණිය )

**රාජකාරි:**

1. නිවාරණ නඩත්තු වැඩසටහන හෝ මතුකර ඇති රැකියා කාඩ්පත් හෝ ලබා දී ඇති උපදෙස් අනුව, නඩත්තු කටයුතු, යන්ත්‍රෝපකරණ, වාහන සහ විවිධ වර්ගයේ පෙරහන් පිරිසිදු කිරීම ඇතුළු ගොඩනැගිලි සම්බන්ධ සියලු කරුණු සඳහා වගකිව යුතුය.

2. හදිසි අවස්ථාවකදී ගිනි නිවීමේ උපකරණ හැසිරවීම.

3. නඩත්තු කටයුතු සඳහා සහභාගී වන විට නිසි මෙවලම් භාවිතා කිරීම.

4. දිනපතා යන්ත්‍ර පරීක්ෂා කිරීම සහ ලැයිස්තුවට අනුව පරීක්ෂා කිරීම පිළිබඳ අදහස් ක්ෂණික අධීක්ෂක වෙත යොමු කිරීම.
5. කනිෂ්ඨයන් පුහුණු කිරීම.
6. ලබා දී ඇති ලැයිස්තුවට අනුව උපයෝගිතා යන්ත්‍රවල දෛනික ක්‍රියාකාරිත්වය සිදු කිරීම සහ යන්ත්‍ර සූත්‍ර පරීක්ෂා කිරීම.
7. හදිසි අවස්ථාවකදී ගිනි නිවීමේ උපකරණ හැසිරවීම.
8. යන්ත්‍රවල දෝෂ නිවැරදි කිරීම.
9. බාහිර වැඩබිම් වලින් අමතර කොටස් අලුත්වැඩියා කර ගැනීම.
10. යහපත් නිෂ්පාදන පුරුදු නඩත්තු කිරීම.
11. සහභාගි විය යුතු සේවා ස්ථානය පිරිසිදු කිරීම.
12. අංශයේ ප්‍රධානියා විසින් පවරන ලද වෙනත් ඕනෑම රාජකාරියකට සහභාගී වීම.

**සුදුසුකම් : බාහිර අයදුම්කරුවන්**

ක්ෂේත්‍රයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 5ට නොඅඩු (NVQ 5) ප්‍රවීණතා සහතිකයක් ලබාගෙන තිබීම.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

ඉහත බාහිර අයදුම්කරුවන්ට අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වැටුප් පරිමාණය** - MA 2-1 – රු. [30,310 - 10 x 300 - 7 x 350 - 4 x 495 - 20 x 660 = 50,940]

**වයස** - අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමය -** ලිඛිත තරඟ විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ඉහත සියළු තනතුරු සඳහා ආන්තික ප්‍රතිලාභ :**

- පැමිණීමේ හා කාර්ය සාධන දිරි දීමනා.
- උපයෝගිකර නොගත් වාර්ෂික හා  වෛද්‍ය නිවාඩු සඳහා මුදල් ගෙවීම.
- වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයක් හා වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය.
- සංස්ථාව විසින් වැටුපෙන් 15% ක්ද , සේවකයා 10% ක්ද වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායක  වීම.
- සංස්ථාව විසින් සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වැටුපෙන් 3% ක් වශයෙන් දායක වනු ඇත.
- 1983 අංක 12 දරණ පාරිතෝෂික දීමනා පණත සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ ප්‍රකාරව පාරිතෝෂික දීමනාව ගෙවීම.
- වෙනත් ආන්තික ප්‍රතිලාභ.

**පොදු උපදෙස් :**

- නියමිත ආකෘති පත්‍රවල සකසන ලද අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් හා විමසුම් විස්තර සමග ඉදිරිපත් කළ යුතුය. සියලුම අධ්‍යාපන සහතිකවල සහතික කළ පිටපත්, අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. අදාළ අයදුම්පත ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://www.spmc.gov.lk වෙතින් බාගත (Download) කර ගත හැකිය.

- රජයේ දෙපාර්තමේන්තු හා ව්‍යාවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත්, අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළයුතු අතර, ආයතන ප්‍රධානී විසින් අයදුම්කරු මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත්, දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකිද යන්න සහතික කළ යුතුය.

- අයදුම්පත බහාලු කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතු අතර අයදුම්පත්, මෙම දැන්වීම් පළවී දින 10ක් ඇතුලත පහත සඳහන්  ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

- ඉහත අවශ්‍යතා සපුරාලනු නොලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරේ.

**සභාපති,**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව,**
**අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවල වත්ත,**
**රත්මලාන.**